මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

වාර්ෂික වාර්තාව - 2018

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
අංක . 01, ඩී.ආර්.විජේවර්ධන මාවත,
කොළඹ -10.

දැක්ම

සැමට සුරක්ෂිත මාර්ග පද්ධතියක්

මෙහෙවර

තිරසර සංවර්ධනය උදෙසා මාර්ග අනතුරුවලින් තොර සමාජයක් බිහිකිරීම.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්යාලය

දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 10 ඩී.ආර්. විජේවර්ධන මාවතේ පිහිටි ප්‍රවාහන අමාත්‍යාංශ පරිශ්‍රයේ කොටසක මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා කාර්යාලය ස්ථාපනය කර ඇත.

කාර්යාලීය ලිපිනය -

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
අංක . 01,
ඩී.ආර්.විජේවර්ධන මාවත,
කොළඹ -10.

දුරකතනය කාර්යාලය	-	0112696890
ෆැක්ස්	-	0112680163
විද්‍යුත් තැපැල් ලිපිනය	-	ncrstransport@gmail.com

පටුන

වාර්ෂික වාර්තාව - 2018
(2018.01.01 සිට 2018.12.31)

විස්තරය	පිටු අංකය
හැදින්වීම	04
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභා සාමාජික සංයුතිය	05
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්ය මණ්ඩලය	06
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුණ	07
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කර්තව්‍යන් හා බලතල	08
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරකම්	09 - 19
මාර්ග අරක්ෂණ අරමුදලට දායකත්වය සපයනු ලබන ලියාපදිංචි රක්ෂණ සමාගම්	20
වාර්ෂික ගිණුම්	21 -38
විගණකාධිපති වාර්තාව	39 - 46
විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු	47 - 49

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

හැඳින්වීම

1998 අංක 05 දරණ මෝටර් වාහන සංශෝධන පනතේ 213 අ සහ 213 ආ වගන්ති යටතේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතනයක් ලෙස ස්ථාපනය කර ඇත. ඒ අනුව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ප්‍රවාහන විෂයය භාර අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන සභාපතිවරයෙකු ඇතුළුව රාජ්‍ය ආයතන 16 ක සහ එක් රාජ්‍ය නොවන ආයතනයක නියෝජිතයෙකු ඇතුළු නියෝජිතයන් 17 කින් සමන්විත ආයතනයකි. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නියෝජනය කරන මෙම සියලු ආයතන මෙරට ප්‍රවාහන හා මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ වගකිවයුතු එකම රාජ්‍ය ආයතනය වේ. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය වන ආදායම් ලබා දෙනු ලබන්නේ රක්ෂණ සමාගම් මගින් වන අතර, ‘‘2004 නොවැම්බර් 24 දිනැති අංක 1368/18 දරණ රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුදල සම්බන්ධයෙන් බලය ලබා දී ඇත. එහි සඳහන් පරිදි , තෘතීය පාර්ෂවයේ අවධානමක් සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි රක්ෂණ ඔප්පුවක් හෝ ඇපයක් රක්ෂණය කරන සෑම රක්ෂණයකු හෝ තැනැත්තෙකු විසින් අරමුදලට වාරික මුදලින් සියයට එකක් (1%) දායක මුදල් වශයෙන් ගෙවනු ලැබිය යුතුය.’’ ඒ අනුව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති සියලුම රක්ෂණ සමාගම් තම ආයතන මගින් රක්ෂණය කරනු ලබන තෙවන පාර්ශවීය සියලුම වාහන සඳහා අයකෙරෙන රක්ෂණ ගාස්තු මුදලින් 1% ක වටිනාකමින් යුත් මුදල මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා අරමුදලට බැර කළ යුතුය.

මෙම අරමුදල මගින් ඉටු කළයුතු කාර්යභාරයන් පිළිබඳව 2005 අප්‍රේල් 04 වන දින නිකුත් කරන ලද අංක 1387/04 දරණ රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කර ඇත.ඉන් එක් වගකිවයුතු ප්‍රධාන කාර්යයක් වනුයේ මාර්ග අනතුරු සිදු කර නොනවත්වා පලා යන වාහන හඳුනාගත නොහැකි බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව එම වාහන අනතුරු වලට ගොදුරු ව මියගිය හෝ ආබාධිත තත්වයට පත් පුද්ගලයන්ට සභාව මඟින් අනුමැතිය ලබා දී ඇති ආකාරයට වන්දි මුදල් ප්‍රදානය කිරීමයි.

මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම, අනතුරු අවම කිරීම, පදික හා මඟී ජීවිත අනතුරු වලට ලක්වීම වළක්වා ගැනීම, මහජනයා දැනුවත් කිරීම ඒ සඳහා අවශ්‍ය නව නීති ඇතුලත් කිරීම හෝ දැනට තිබෙන නීති සංශෝධනය කිරීම සඳහා විෂය භාර අමාත්‍යතුමන්ට උපදෙස් ලබාදීම ඇතුළු සමස්ථයක් ලෙස සියලුම පිඩාකාරී ක්‍රියා බැහැර කරමින් මාර්ග ආරක්ෂාව තහවුරු කිරීමේ කාර්යයන් සඳහා මෙම අරමුදලෙහි තැන්පත් වන මුදල් ප්‍රයෝජනයට ගතහැකි වනු ඇත.

එසේම මාර්ග ආරක්ෂාව පිළිබඳ සියලු පරිපාලන හා අනෙකුත් වියදම් දැරීමද මෙම අරමුදල මඟින් සිදු කළ යුතුය.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා සාමාජිකයන්

01 වෛද්‍ය සිසිර කෝදාගොඩ මහතා	-	සභාපති, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
02. ඒ.එම්.ආර්.ජේ.කේ.ජයසිංහ මහතා	-	ලේකම් , මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
03. . එම්.යූ.එස් .ප්‍රියදර්ශන මහතා	-	ගණකාධිකාරී, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
04. වයි.ඒ.එන්.ඩි.යාපා මහතා	-	අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය
05. එම්.ගංගාදරන් මහත්මිය	-	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, මුදල් අමාත්‍යාංශය
06. නයනා නාථවිතාරණ මිය	-	අති. ලේකම් (පාලන හා මුදල්), පළාත් සභා හා පළාත් පාළන අමාත්‍යාංශය.
07. පී.ඩී.එස්.විජේරත්න මයා	-	අතිරේක ලේකම් , උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය
08. එච්.ආර්.පසිඳු මහතා	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මොරටුව විශ්වවිද්‍යාලය
09. ජනක් රණවීර මහතා	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය
10. ආර්.ඒ.සුදත් මහතා	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ(සැලසුම්) , මාර්ග සංවර්ධන අධිකාරිය
11. එස්.එස්.ඒ.කුලරත්න මහතා	-	අධ්‍යක්ෂ (සැලසුම්), ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
12. එම්.ඒ.පී. හේමචන්ද්‍ර මහතා	-	සභාපති, ජාතික ගමනා ගමන කොමිෂන් සභාව
13. ජේ.ඒ. එස්.ජයවීර මහතා	-	සහකාර කොමසාරිස් (කාර්මික), මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
14. පී.ඩී. බාලසූරිය මහතා	-	ප්‍රධාන විධායක නිලධාරි, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
15. කේ.එස්.එම්.සමරසේකර මිය	-	වෛද්‍ය නිලධාරී, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය
16. ධම්මික ආටිගල මහතා	-	සභාපති, ශ්‍රී ලංකා ඔටෝ මොබයිල් සංගමය
17. ඉන්දික හපුගොඩ මහතා	-	අධ්‍යක්ෂ, (රථ වාහන) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
18. ජී.ඒ.සි.ආර්. ගනේපොල මහත්මිය	-	නියෝජ්‍ය අධ්‍යක්ෂක (රථ වාහන), කොළඹ මහ නගර සභාව
19. එච්.ඒ.එල්.එල්. විජේසිංහ මහතා	-	ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරී , ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය
20. පුෂ්පා රම්‍යාණි සොයිසා මෙනවිය	-	ලේකම්, ශ්‍රී ලංකා අනතුරු වැලැක්වීමේ සංගමය.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්යය මණ්ඩලය.

1.	වෛද්‍ය සිසිර කෝදාගොඩ මහතා	-	සභාපති , මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
2.	ඒ.එම්.ආර්.ජේ.කේ.ජයසිංහ මහතා	-	ලේකම් , මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
3.	එම්.යූ.එස් .ප්‍රියදර්ශන මහතා	-	ගණකාධිකාරී, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව.
4.	ඩබ්.පි.ජේ.සෙව්වන්දිකා මිය	-	සංවර්ධන නිලධාරී
5.	ජේ.ඩී.ආර්.ජයසිංහ මිය	-	සංවර්ධන නිලධාරී
6.	කේ.බී.එන්.ගිෂාන් කුමාර් මහතා	-	සංවර්ධන නිලධාරී
7.	අයි.එන්.පි.ජයසිංහ මිය	-	කළමනාකරණ සේවා නිලධාරී
8.	පි.ඒ.චිත්‍රානි ජයතිස්ස මිය	-	කළමනාකරණ සේවා නීලධාරී
9.	බී.පි.ඒ.රුවන් මහතා	-	ලිපිකරු
10.	ඊ.ජී. එස්.ඒකනායක මහතා	-	කොන්ත්‍රාත් නිලධාරී
11.	ජී.ඒ.බුද්ධික ප්‍රභාත් මහතා	-	තාක්ෂණ ශිල්පී සහයක
12.	කේ.එල්.ඩී.එන්.ජයවර්ධන මහතා	-	කාර්යාල කාර්ය සහයක
13.	ජී.ඒ.චානකී පැළවත්ත මහත්මිය	-	කාර්යාල කාර්ය සහයක

අරමුණු

- විනය ගරුක හා නීති ගරුක රියදුරන් බිහි කිරීම තුළින් ඉහළ ගුණාත්මක රියදුරු සේවාවක් බිහි කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම.
- හප්පා පලා යෑම නිසා විඳිත වූ පවුල් සඳහා මූල්‍යාධාර ලබා දීම සහ එවැනි අනතුරු අවම කිරීමට ක්‍රියා කිරීම.
- මාර්ගය සහ එය භාවිතා කරන වාහන හා ගමන් ගන්නා මගීන් ඇතුළු පදිකයින්ගේ ආරක්ෂාව සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම.
- මාර්ග ආරක්ෂාව පිළිබඳ දත්ත එක් රැස් කිරීම, සමීක්ෂණ හා පර්යේෂණ පැවැත්වීම සහ අන්තර් ජාතික සම්බන්ධීකරණය වර්ධනය කර ගැනීම.
- රාජ්‍ය අංශය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික ආයතන සමග එක්ව ජාතික මාර්ග ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම හා පැන නැගෙන දුර්වලතා අවම කර ගැනීම.
- මාර්ග අනතුරු නිසා ආබාධිත තත්වයට පත්වන පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
- මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම හා මාර්ග අනතුරු අවම කිරීමට අදාලව ආර්ථික තාක්ෂණික සහ සමාජීය වශයෙන් ක්‍රියාත්මක කලහැකි ක්‍රියාකාරකම් සහ පරිසර හිතකාමී ආරක්ෂිත පියවර අනුගමනය කිරීම සඳහා මූල්‍යාධාර සහ උපදෙස් ලබාදීම.
- ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය සැකසීමට හා එහි ක්‍රියාකාරීත්වයට දායකත්වය ලබා දීම.
- මාර්ග ආරක්ෂාවට අදාල නීති සැකසීම සංශෝධනය වැනි ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කර්තව්‍යයන් හා බලතල

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සතු කාර්යභාරය හා කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් බලය ලබාදී ඇත්තේ 2005 අප්‍රේල් 04 වන දින නිකුත් කරන ලද අංක 1387/4 දරණ රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගිනි. එම ගැසට් පත්‍රය මගින් නියෝග කර ඇති පරිදි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් සිදුකළයුතු කර්තව්‍ය පහත පරිදි වේ.

(අ) පහත දැක්වෙන දෑ පිළිබඳ පරිගණක දත්ත ගබඩාවක් පවත්වා ගෙන යෑම.

I. රථ වාහන ප්‍රමාණය සහ ඒවායේ ලක්ෂණ සහ සංයුතිය.

II. මාර්ග අනතුරු

III. මාර්ග ආරක්ෂාව පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර සංඛ්‍යා ලේඛන.

(ආ) මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ පුස්තකාලයක් පවත්වාගෙන යෑම.

(ඇ) සම්බන්ධිත විෂයයන් පිළිබඳ තොරතුරු රැස් කිරීම, පර්යේෂණ පැවැත්වීම සහ ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම.

(ඈ) සම්බන්ධිත විෂයයන් පිළිබඳ පර්යේෂණ වලට ආධාර කිරීම.

(ඉ) සමාන ජාත්‍යන්තර ආයතන සමග සබඳතා පැවැත්වීම සහ පළපුරුදු පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම.

(ඊ) මාර්ග ආරක්ෂාව සහ සම්බන්ධිත විෂයනුබද්ධ ව්‍යාපෘති කෙරෙහි වගකීම දරණ රාජ්‍ය සහ රාජ්‍ය නොවන අදාල ආයතන වලට දැනුම හා තොරතුරු ලබාදීම.

(උ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාවට නැංවීම.

(ඌ) රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන තුළ මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.

(ඔ) හඳුනා නොගත් වාහන වලින් අනතුරට පත් තැනැත්තන්ට වන්දි ගෙවීම.

(ඕ) මාර්ග ආරක්ෂාව පිළිබඳ කටයුතු සඳහා මූල්‍යමය හා වෙනත් සහාය ලබා ගැනීම.

(ඒ) මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත ප්‍රතිපත්තීන් සහ ව්‍යාපෘති පිළිබඳව රජයට උපදෙස් ලබාදීම.

2018 වර්ෂය තුළ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරකම්

01.1.1 පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන

පාසල් රිය නියාමක සේවය වඩාත් පුළුල් ක්‍රමවේදයකට යොමු කරමින් රිය අනතුරු වළක්වා ගැනීම සම්බන්ධව පාසල් සිසුන් දැනුවත් කිරීමේ දේශන පවත්වා අනතුරු සම්බන්ධ වීඩියෝපට ප්‍රදර්ශනය කර අත්පත්‍රිකා බෙදාදීම සහ ශිෂ්‍ය රිය නියාමක වැඩසටහන අවට පාසල් 10 ක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහභාගීත්වයෙන් 2018.01.11 දින කොළඹ ආනන්ද විද්‍යාලයේදී පැවැත්විණ.

ආනන්ද විද්‍යාලයේදී ජාතික මට්ටමින් විද්‍යාලයට ගෞරවයක් ගෙනදීම වෙනුවෙන් ආදි ආනන්දිය මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභාපති වෛද්‍ය සිසිර කෝදාගොඩ මහතාට සිය සේවය අගයමින් ආනන්ද විද්‍යාලයීය විදුහල්පතිතුමන් අතින් උපහාර සම්මානයක් පිරිනැමීම ද මෙහිදී සිදුවූ අතර එම උත්සවයේ විශේෂ ආරාධිත දේශනය මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභාපති වෛද්‍ය සිසිර කෝදාගොඩ මහතා සිදු කරන ලදී.



පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන - කොළඹ ආනන්ද විද්‍යාලය

බොරැල්ල යසෝදරා බාලිකා විද්‍යාලය ඉදිරිපිට සොලර් නිවී දැල්වෙන විදුලි පහන් කණුව ස්ථාපිත කිරීම හා ඊට සමගාමීව පාසල් සිසුන් දැනුවත් කිරීම, අනතුරු සම්බන්ධ වීඩියෝපට ප්‍රදර්ශනය හා අත්පත්‍රිකා බෙදා දීම සහ ජාතික පාසල් ශිෂ්‍ය රිය නියාමක වැඩසටහන, අවට පාසල් කිහිපයක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහභාගීත්වයෙන් 2018.06.08 යසෝදරා බාලිකා විද්‍යාලයේදී පැවැත්විණ.



බොරැල්ල යසෝදරා බාලිකා විද්‍යාලය ඉදිරිපිට ස්ථාපනය කල සොලර් නිවී දැල්වෙන විදුලි පහන් කණුව



පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන - බොරැල්ල යසෝදරා බාලිකා විද්‍යාලය

2018.04.04 වන දින සිට 2018.04.06 වන දින දක්වා පුරා තෙදිනක මතුගම කඹුරාවල මහා විද්‍යාලයේ මාර්ග ආරක්ෂාව පිළිබඳව අධ්‍යාපනික ප්‍රදර්ශනයක් පැවැත්වූ අතර, එය පාසල් ළමුන්ගේ දැනුම වර්ධනය සඳහා වැඩසටහන් ගණනාවකින් සමන්විත විය. තවද, 2018.07.07 වන දින මොරටුව විශ්ව විද්‍යාලය සමඟ එක්ව මාර්ග ආරක්ෂාව පිළිබඳ පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ද පවත්වන ලදී.

2018.09.13 වන දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොතලාවල මහා විද්‍යාලයේදී සහ 2018.09.14 වැල්ලව මධ්‍ය මහා විද්‍යාලයේදී පාසල් සිසුන් දැනුවත් කිරීම සිදුවූ අතර, මෙහිදී අනතුරු සම්බන්ධ වීඩියෝපට ප්‍රදර්ශනය හා අත්පත්‍රිකා බෙදා දීමද සිදු කරන ලදී. පාසල ඇතුලත පරිශ්‍රයේ ආදර්ශ සංඥා පුවරු සවි කිරීමද සිදුවිය.



කොතලාවල මහා විද්‍යාලය



වැල්ලව මධ්‍ය මහා විද්‍යාලය

2018.10.31 වැනි දින වයඹ රාජකීය විද්‍යාලය

2018.10.31 කුරුණෑගල දිස්ත්‍රික්කයේ වයඹ රාජකීය විද්‍යාලයේදී පාසල් සිසුන් දැනුවත් කිරීම සිදුවූ අතර, අනතුරු සම්බන්ධ වීඩියෝපට ප්‍රදර්ශනය හා අත්පත්‍රිකා බෙදා දීමද සිදු කරන ලදී. පාසල ඇතුලත පරිශ්‍රයේදී සංඥා පුවරු සවි කිරීමද සිදුවිය.





කුරුණෑගල දිස්ත්‍රික්කයේ වයඹ රාජකීය විද්‍යාලය

1.1.2 හෙද විදුහල් වල පුහුණු වන හෙද සිසුන් දැනුවත් කිරීම.

2018.07.12 වැනි දින මාර්ග ආරක්ෂාව පිළිබඳව හෙද සිසු සිසුවියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් කඳාන හෙද විදුහලේදී පැවැත්විණ.



හෙද සිසුන් දැනුවත් කිරීම

ඉහත වැඩසටහන යටතේම 2018.12.03 වැනි දින හෙද පුහුණු විද්‍යාලවල පුහුණුව ලබන හෙද සිසුවියන් මාර්ග ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් කළුතර හෙද විදුහලේදී ද පවත්වන ලදී.



කළුතර හෙද විදුහල

1.1.3 ගුරු විද්‍යාලවල පුහුණු වන සිසු සිසුවියන් දැනුවත් කිරීම.

2018.07.21 වැනි දින ගුරු පුහුණු විද්‍යාලවල පුහුණුව ලබන ගුරු සිසුවියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ දී පැවැත්විණි. මේ සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් රු.21,630 ක මුදලක් වැය කරන ලදී.



මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයීය සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන

1.1.4 පෞද්ගලික ආයතන වල රියදුරන් දැනුවත් කිරීම.

පෞද්ගලික ආයතන වල රියදුරන් අතින් සිදුවන අනතුරු අවම කර ගැනීම මූලික අරමුණ කර ගනිමින් ඒ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 2018.02.26, 2018.02.28, හා 2018.03.09 යන තෙදින තුළ මීරිගම, කටුනායක හා අවිස්සාවේල්ල බ්‍රැන්ඩික්ස් ආයතනයන්හි පවත්වන ලදි.





දැනුවත් කිරීමේ වැඩසටහන - බ්‍රැන්ඩික්ස් ආයතනය අවිස්සාවේල්ල සහ කටුනායක

1.1.5 රාජ්‍ය ආයතනවල රියදුරන් දැනුවත් කිරීම.

2018.01.12 වැනි දින ‘‘කල වරද නැවත සිදු නොකරන්නට නම් මනසින් ශක්තිමත් වෙමු’’ මැයෙන් රියදුරු පුනරුත්ථාපන වැඩසටහනක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරන් සඳහා නාරාහේන්පිට ශ්‍රීලංගම ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී. තවද, 2018.07.13 වැනි දින සීමාසහිත ගුවන් තොටුපල හා සිවිල් ගුවන් සේවා සමාගමේ රියදුරන් හා නිලධාරීන් සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි.



ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය නාරාහේන්පිට

1.1.6.1 ත්‍රීරෝද රථ හා අනිකුත් නව රියදුරු බලපත්‍ර අයදුම්කරුවන් දැනුවත් කිරීම.

2018 වර්ෂයේ අගෝස්තු දක්වා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් වැඩසටහන් 10 ක් පවත්වා ඇති අතර ඒ සඳහා රු. 74,570.00 ක වියදමක් දරා ඇත. සතියේ සෑම බ්‍රහස්පතින්දා දිනකම කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී මෙම දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීම සිදු කරන ලදී.



ත්‍රීරෝද රථ රියදුරන් දැනුවත් කිරීම
කොළඹ මහජන පුස්තකාල ශාලාව

1.1.6.2 තාක්ෂණික රියදුරු පුහුණු ඒකකය ස්ථාපිත කිරීම.

2018.12.12 වන දින ජපානයේ Niigata Tsushinki Co.Ltd ආයතනයේ පරිත්‍යාගයක් වශයෙන් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභාපතිතුමාට ලබා දුන් විද්‍යුත් තාක්ෂණික රියදුරු පුහුණු යන්ත්‍ර කට්ටල තුන මරදාන අමාත්‍යාංශ පරිශ්‍රයේ විශේෂ ඒකයක් ස්ථාපිත කිරීම සිදු කර ලදි.එම ඒකකය විවෘත කිරීම Niigata Tsushinki Co.Ltd ආයතනයේ සභාපති විසින් සිදු කරන ලදි



තාක්ෂණික රියදුරු පුහුණු ඒකකය ස්ථාපිත කිරීම

1.1.7 මොණරාගල මහ රෝහලේ වෛද්‍ය හා හෙද සේවා නිලධාරීන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන.

මොණරාගල මහ රෝහලේ වෛද්‍ය හා හෙද සේවා නිළධාරීන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන රෝහල් අධ්‍යක්ෂතුමන් ප්‍රමුඛ වෛද්‍යවරුන්, හෙදියන් ,ගිලන් රථ රියදුරන් ඇතුළු සේවකයන්ගේ සහභාගිත්වයෙන් 2018.01.09 වන දින පවත්වන ලද අතර, එදින පාපැදිකරුවන්ට පරාවර්ථීත ස්ටිකර් ලබා දීම සිදු කරන ලදී.

මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ද පාපැදිකරුවන්ගේ ජීවිත සුරැකීමේ වැඩසටහන සිදු කළ අතර, අඳුරේදී පාපැදි අනතුරු සිදුවීම වැඩිහෙයින් එම අනතුරු අවම කිරීම සඳහා පාපැදිවල පරාවර්ථීත ස්ටිකර් ඇලවීමේ වැඩසටහන සිදු කරන ලදී. මේ සඳහා රු.25,160 ක මුදලක් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් දරන ලදී.



රෝහල් කාර්ය මණ්ඩල දැනුවත් කිරීමේ වැඩසටහන - මොණරාගල මහ රෝහල

ජාතික වැඩසටහන් යටතේ 2018 අගෝස්තු මස 29,30,31 යන දිනයන්හි මොණරාගල එන්ටප්‍රයිසස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනයේදී මා.ආ.පි.ජා.ස. මගින් ප්‍රදර්ශන කුටියක් ස්ථාපිතව තිබුණු අතර, එහිදී රාජ්‍ය සේවකයින්,සිවිල් වැසියන් සහ පාසල් ළමුන් මාර්ග ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීම් සිදු කරන ලදී. මෙහිදී අනතුරු සම්බන්ධ විඩියෝපට ප්‍රදර්ශනය හා අත්පත්‍රිකා බෙදා දීමද සිදුවිය.

‘‘අද වෙහෙසෙමු හෙට සතුටු වෙමු’’ යන තේමාව යටතේ එන්ටප්‍රයිසස් ශ්‍රී ලංකා ජාතික වැඩසටහනට සමගාමීව දිවයින පුරා පැවැත්වීමට නියමිත දිස්ත්‍රික් මාර්ග ආරක්ෂණ ඒකක දැනුවත් කිරීමේ වැඩසටහනේ සමාරම්භක වැඩසටහන මාතර දිස්ත්‍රික්කය මූලික කර ගනිමින් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ ලේකම් ජී.එස්.විතානගේ මැතිතුමාගේ සහභාගීත්වයෙන් සනත් ජයසූරිය ක්‍රීඩාංගනයේදී 2018.09.29 වන දින පවත්වන ලදී. එහිදී පහත සඳහන් වැඩසටහන් පවත්වන ලදී.

- රිය අනතුරු වලට ලක්වී ආබාධිත වූ පාසල් ළමුන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය
- හප්පා පලා ගොස් ජීවිතක්ෂයට පත්වූ සහ ආබාධිත තත්ත්වයට පත්වූ චින්දිතයන් සඳහා වන්දි ප්‍රදානය
- ත්‍රි රෝද රථ රියදුරන්ගේ පවුල් ආර්ථික මට්ටමින් උසස් කිරීම සඳහා ඔවුන්ගේ භාර්යාවන් සඳහා ස්වයං රැකියා පුහුණු වැඩමුළු සඳහා බඳවා ගැනීම හා පුහුණුව නිමකළ අය සඳහා සහතික පත්‍ර ප්‍රදානය සිදු කරන ලදී.
- රැකියා නොමැති තරුණ තරුණියන් ස්වෘත්තීය පුහුණුව සඳහා යොමු කිරීම මගින් ශ්‍රමබලකාය ශක්තිමත් කිරීම හරහා ඉදිරියේදී රියදුරු බලපත්‍ර ලබාදීමේ වයස අවුරුදු 35 දක්වා ඉහළ දැමීමෙන් ඇතිවිය හැකි ගැටළු සහගත තත්ත්වයන් අවම කිරීම.

1.1.8 දුම්රිය අනතුරු අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන.

දුම්රිය මගින් අනතුරට ලක්වීම අවමකර ගැනීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ එක්ව සිදු කරන ලද මෙම වැඩසටහන යටතේ 2018.04.02 හා 2018.06.26 යන දෙදින තුළ රාගම, මොරටුව හා පයාගල දුම්රිය ස්ථානවලත්, 2018.09.13 මුත්තෙට්ටුගල දුම්රිය ස්ථානයේදී 2018.09.14 දින කුරුණෑගල වැල්ලව දුම්රිය ස්ථානයේත් 2018.09.29 වන දින මාතර දුම්රිය ස්ථානයේදී දැනුවත් කිරීමේ පුවරු ස්ථාපනය කර විවෘත කිරීම සිදු කරන ලදී. ඒ සඳහා අනුග්‍රාහක ආයතන විසින් වියදම් දරන ලදී.





පයාගල දුම්රිය ස්ථානය සහ රාගම දුම්රිය ස්ථානයේ පුවරු සවි කිරීම





වැල්ලව දුම්රිය ස්ථානයේ සහ මාතර දුම්රිය ස්ථානයේ පුවරු සවි කිරීම

ඉහත ජාතික වැඩසටහන යටතේම දුම්රිය මගින් අනතුරට ලක්වීම අඩුකර ගැනීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ එක්ව 2018.12.13 මහනුවර දුම්රිය ස්ථානයේද 2018.12.14 හිගුරක්ගොඩ දුම්රිය ස්ථානයේ සහ එදිනම අනුරාධපුර දුම්රිය ස්ථානයේදී දැනුවත් කිරීමේ පුවරු ස්ථාපනය කර විවෘත කිරීම සිදු කරන ලදී. ඒ සඳහා අනුග්‍රාහක ආයතන විසින් වියදම් දරන ලදී.






මහනුවර දුම්රිය ස්ථානය,හිගුරක්ගොඩ දුම්රිය ස්ථානය,අනුරාධපුර දුම්රිය ස්ථානය

1.1.9 පොදු මගී ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්.

2018.02.20 වන දින කැස්බෑව සම්බුද්ධාලෝක විහාරස්ථානයේදී ප්‍රධාන මාර්ග පුළුල් කිරීමේ දී මාර්ගය දෙපස ජනතාවට සිදුවන හානි අවම කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන සමඟ පානදුර - කැස්බෑව මාර්ගය, අධිවේගී මාර්ගය තෙක් පුළුල් කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් මාගා ආයතනයේ අනුග්‍රහයෙන් පවත්වන ලදි. එමෙන්ම 2018.02.24 වන දින මාලඹේ මාළිගාගොඩැල්ල ප්‍රජා ශාලාවේ දී ද එවැනිම වූ දැනුවත් කිරීමේ වැඩසටහනක් මාගා ආයතනයේ අනුග්‍රාහක දායකත්වයෙන් පවත්වන ලදී.

1.1.10 සංචාරක සේවය වර්ධනය කිරීම සඳහා සුදුසු ත්‍රිරෝද රථ රියදුරන් පුහුණු කිරීම.

2018.03.10 වැනි දින සංචාරකයින්ට වඩාත් ඉහළ ප්‍රමිතියකින් යුත් සේවාවක් ලබා දීම සඳහා ත්‍රිරෝද රථ රියදුරන් පුහුණු කිරීමේ වැඩසටහනක් මුදල් අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව සිදු කරන ලදී. ඒ යටතේ පළමු ත්‍රිරෝද රථ රියදුරන් කණ්ඩායම පුහුණු කිරීම 2018 03.10 වන දින සිට මරදාන අමාත්‍යාංශ පරිශ්‍රයේදී සිදු කරන ලදී.



සංචාරක සේවය සඳහා සුදුසු ත්‍රිරෝද රථ රියදුරන් පුහුණු කිරීම

1.1.11 ත්‍රිරෝද රථ මීටර් අනිවාර්ය කිරීම.

2018.04.20 වන දින ත්‍රිරෝද රථ මීටර් අනිවාර්ය කිරීම සම්බන්ධව මාධ්‍ය දැනුවත් කිරීම මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභාපතිතුමා විසින් මරදාන අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී සිදු කරන ලදී. එමෙන්ම මීටර් නිපදවන්නන් සහ ආනයනය කරන ආයතන දැනුවත් කිරීම සඳහා 2018.04.26 වන දින මීටර් අනිවාර්ය කිරීම සම්බන්ධව මීටර් නිපදවන්නන් සහ ආනයනය කරන ආයතන දැනුවත් කිරීම ද සිදු කරන ලදී.



ත්‍රිරෝද රථ මීටර් අනිවාර්ය කිරීම සම්බන්ධව මාධ්‍ය දැනුවත් කිරීම



මීටර් නිපදවන්නන් සහ ආනයනය කරන ආයතන දැනුවත් කිරීම

1.1.12 CCTV කැමරා සවි කිරීම සම්බන්ධව චීන නියෝජිතයින් සමග සාකච්ඡා කිරීම.

2018.05.02 වන දින රිය අනතුරු බහුල ප්‍රදේශයන්හි CCTV කැමරා සවි කිරීම සම්බන්ධව චීන නියෝජිතයන් සමග සාකච්ඡාවක් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභාපතිතුමා විසින් සිදු කරන ලදී.



චීන නියෝජිතයින් සමග සාකච්ඡාව

1.1.13 මාර්ග ආරක්ෂාවට නව ප්‍රවේශයක් යන මැයෙන් පැවැත්වූ විද්වත් සමුළුව.

ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුග්‍රාහක දායකත්වය ඇතිව "නීතිය සවිබල ගැන්වීම තුළින් මාර්ග ආරක්ෂාව තහවුරු මැයෙන් 2018.05.08 වන දින ද "රථවාහන තදබදය අවම කිරීමට විද්‍යාත්මක කළමනාකරණයක්" මැයෙන් 2018.05.09 දින ද කමිටු රැස්වීම් දෙකක් පැවැත්වූ අතර, "මාර්ග ආරක්ෂාවට නව ප්‍රවේශයක්" යන මැයෙන් 2018.05.10 සහ 11 දෙදින ප්‍රධාන සමුළුව දේශීය හා විදේශීය විද්වතුන්ගේ සහභාගීත්වයෙන් කොළඹ කිංස්බරි හෝටලයේදී පවත්වන ලදී. මේ සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් රු.61,460 ක වියදමක් දරන ලද අතර, ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ඒ සඳහා අවශ්‍ය අනෙකුත් සියලුම මූල්‍ය අනුග්‍රහකත්වය දක්වා ඇත.



අන්තර් ජාතික විද්වත් සමුළුව - කිංග්ස්බරි හෝටලය

1.1.14 මාර්ග ආරක්ෂණ ඒකක පිහිටුවීමේ වැඩසටහන

2018.05.15 වැනි දින සබරගමුව පළාත් මාර්ග ආරක්ෂණ ඒකකය පිහිටුවීම සබරගමු පළාත් ආණ්ඩුකාර ගරු නිලූකා ඒකනායක මහත්මියගේ ප්‍රධානත්වයෙන් සහ පළාත් ප්‍රධාන ලේකම්තුමා ඇතුළු ක්ෂේත්‍රයට අදාල පළාත් ආයතන නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණ.

2018.11.29 වැනි දින නැගෙනහිර පළාත් මාර්ග ආරක්ෂණ ඒකකය පිහිටුවීම පළාත් ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ක්ෂේත්‍රයට අදාල පළාත් ආයතන නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණ.



සබරගමුව පළාත් මාර්ග ආරක්ෂණ ඒකකය පිහිටුවීම හා නැගෙනහිර පළාත් මාර්ග ආරක්ෂණ ඒකකය පිහිටුවීම

1.1.15. හප්පා පළා ගිය, අනතුරුවලට ලක්වූ චින්දිතයන් හට වන්දි ලබා දීම

2018.10.01 වන දින බත්තරමුල්ල ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පැවැත්වූ අතර, මෙහිදී චින්දිතයන් 12 දෙනෙකු සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මූල්‍ය ප්‍රදානයන් සිදු කරන ලදී.



චින්දිතයන් හට වන්දි ප්‍රදානය කිරීම

මාර්ග ආරක්ෂණ අරමුදලට දායකත්වය සපයනු ලබන ලියාපදිංචි රක්ෂණ සමාගම්.

01. අමානා ටකාෆුල් රක්ෂණ සමාගම	-	නො 660/1, ගාලු පාර, කොළඹ - 03.
02. අලියාන්ස් රක්ෂණ සමාගම	-	නො 46/10 නවම් මාවත, කොළඹ - 02.
03. සෙලින්කෝ රක්ෂණ සමාගම	-	3 වන මහල, ‘‘සෙලින්කෝ නිවාස’’, නො 69, ජනාධිපති මාවත, කොළඹ - 01.
04. කොන්ටිනෙන්ටල් රක්ෂණ සමාගම	-	නො 79, සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මාවත, කොළඹ - 07
05. සී./ස. සමූපාකාර රක්ෂණ සමාගම	-	‘‘රක්ෂණ නිවාස’’,නො 74/05, ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ - 14.
06. එච්.එන්.බී. රක්ෂණ සමාගම	-	නො 30, ශ්‍රී උත්තරානන්ද මාවත, කොළඹ - 03.
07. ජනශක්ති රක්ෂණ සමාගම	-	නො 675, ඩැනිස්ටර් ද සිල්වා මාත,, කොළඹ09.
08. එල්.ඕ.එල්.සී. රක්ෂණ සමාගම	-	නො 481, ටී.බී ජයා මාවත, කොළඹ - 10.
09. ජාතික රක්ෂණ භාරකාර අරමුදල	-	නො 97, මරදාන පාර, කොළඹ -10.
10. ඔරියන්ට් රක්ෂණ සමාගම	-	අංක.79,සී.ඩබ්.ඩබ් කන්නන්ගර මාවත,කොළඹ -07.
11. පීපල්ස් රක්ෂණ සමාගම	-	නො 53,ධර්මපාල මාවත, කොළඹ - 03.
12. සී/ස සණස රක්ෂණ සමාගම	-	නො 340, 2/1, ආර්.ඒ.ද.මෙල් මාවත,කොළඹ - 03.
13. ශ්‍රී ලංකා රක්ෂණ සමාගම	-	නො 21, වොක්ෂෝල් වීදිය , කොළඹ - 02.
14. ෆෙයාෆස්ට් රක්ෂණ සමාගම	-	ඇක්සස් ටවර්ස් 11,(14 වන මහල) නො.278/4 , යුනියන් පෙදෙස, කොළඹ 02.

වාර්ෂික ගිණුම් - 2018

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

ආදායම	සටහන්	2018 රු.	2017 රු.
රක්ෂණ සමාගම් වලින් දායකත්වය	1	44,386,270.00	42,004,279.16
වෙනත් ආදායම්	2	21,624,586.14	20,771,325.01
මුළු ආදායම		**66,010,856.14**	**62,775,604.17**
අඩු කිරීම - වියදම්	4	14,004,318.81	17,815,890.94
අතිරික්තය		**52,006,537.33**	**44,959,713.23**

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

2018 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන්	2018 රු	2017 රු
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපොළ, පිරියත හා උපකරණ	5	1,819,786.25	2,238,070.00
මුළු ජංගම නොවන වත්කම්		1,819,786.25	2,238,070.00
ස්ථාවර තැන්පත්		84,000,000.00	14,000,000.00
භාණ්ඩාගාර බිල්පත්	3	235,548,983.16	216,417,298.79
ජංගම වත්කම්			
රක්ෂණ සමාගම් වලින් ලැබියයුතු රක්ෂණ සමාගම් දායකත්වය		3,397,889.23	3,308,522.48
ස්ථාවර තැන්පත් පොළී වලින් ලැබියයුතු ස්ථාවර තැන්පත් පොළිය		140,972.60	104,856.16
නොපියවූ අත්තිකාරම් මුදල්			
බැංකු ගත මුදල	6	31,818,550.63	69,035,765.37
මුළු ජංගම වත්කම්		354,906,395.62	302,866,442.80
අඩු කිරීම - ජංගම වගකීම්			
ගෙවියයුතු විගණන ගාස්තු		171,130.00	104,000.00
		171,130.00	104,000.00
ශුද්ධ වත්කම්		**356,555,051.87**	**305,000,512.80**
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා අරමුදල ගිණුම			
අරමුදල් ගිණුමේ ශේෂය		304,548,514.54	260,040,799.57
වියදමට වඩා ආදායමේ අතිරික්තය		52,006,537.33	44,959,713.23
මුළු අරමුදල් සැපයීම		**356,555,051.87**	**305,000,512.80**

5 වන පිටුවේ සිට 6 වන පිටුව දක්වා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසකි.

සහතිකකරණය

2018 දෙසැම්බර් 31 දින වන විට ඉහත මූල්‍ය ප්‍රකාශන සහ 2018 දෙසැම්බර් 31 න් අවසන්වන වර්ෂය සඳහා එහි අතිරික්තය/(හිඟය) මගින් සත්‍ය හා සාධාරණ මතයක් ඉදිරිපත්වන බව සහතික කරමු. මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම හා ඉදිරිපත්කිරීම මෙම සභාවේ වගකීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සභාව විසින් අනුමත කර ඔවුන් වෙනුවට අත්සන්කරනු ලැබ ඇත.

ගණකාධිකාරී
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
සභාව

Mr. U. S. Priyadarshana
Accountant
Ministry of Transport & Civil Aviation
7th Floor Sethsiripaya (Phase II)
BATTARAMULLA

Eng. J. A. S. Jayawardhana
(MASME, MIMI,MIRTE,AMIB,AMSOE,MPM
Pg. Dip. Mech. Eng)
Assistant Commissioner (Tech)
Dept. of Motor Traffic
Colombo 05.

සභාපති
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික

Dr. S. Kodagoda
Chairman N C R S
Ministry of Transport and Civil Aviation
D R. Wijewardena Mawatha
Colombo 10

2019/5/8

W. N. D. Jayawardena
Senior Assistant Secretary (Institute Admin)
Ministry of Transport & Civil Aviation
7th Floor, Sethsiripaya (Stage II)
Battaramulla.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා
වක්‍ර ක්‍රම මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2018	**2017**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල්	රු	රු
බදු පෙර ලාභය	52,006,537.33	44,959,713.23
ගැලපුම්		
පූර්ව වර්ෂයේ ගැලපුම් (ශුද්ධ) සඳහා	(451,998.26)	
ක්ෂය	418,283.75	316,075.58
	51,972,822.82	**45,275,788.81**
වෙළඳ හා වෙනත් අයවියයුතු දේ වැඩිවීම	(125,483.19)	3,103.38
වෙළඳ ගෙවියයුතු දේ අඩුවීම	67,130.00	52,000.00
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල	51,914,469.63	45,330,892.19
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල	**51,914,469.63**	**45,330,892.19**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල		
දේපොළ, පිරියත සහ උපකරණ මිළ දී ගැනීම්	-	(658,900.00)
උපකරණ විකිණීමේ ප්‍රගතිය		
ලැබුණු පොළිය	(19,131,684.37)	(19,161,899.28)
ස්ථාවර තැන්පතු නැවත ආයෝජනය	(70,000,000.00)	-
ආයෝජන කටයුතු සඳහා ජනනය වූ ශුද්ධ මුදල	**(89,131,684.37)**	**(19,820,799.28)**
මූල්‍යයන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල්		
කොටස් ප්‍රාග්ධනය නිකුත්කිරීමෙන් ලබන මුදල		-
		-
දීර්ඝ කාලීන ණය ලබාගැනීමෙන් ලබන මුදල		
මූල්‍ය කල්බදු වගකීම් ගෙවීම		-
ගෙවන ලද ලාභාංශ		-
මූල්‍යයන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල	-	-
මුදල් සහ මුදල් සම ශුද්ධ වැඩිවීම	**(37,217,214.74)**	**25,510,092.91**
කාල පරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ	**69,035,765.37**	**43,525,672.46**
කාල පරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ	**31,818,550.63**	**69,035,765.37**

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
2018.12.31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම් වෙනස් වීම් පිළබඳ ප්‍රකාශය

	අරමුදල් ගිණුම රු.	මුලු මුදල රු.
2017/01/01 දිනට ශේෂය	260,040,799.57	260,040,799.57
වසර සඳහා ආදායම් අතිරික්තය	44,959,713.23	44,959,713.23
2016/12/31 දිනට ශේෂය	305,000,512.80	305,000,512.80
පූර්ව වර්ෂයේ ගැලපුම		
අරමුදල ගිණුම	305,000,512.80	305,000,512.80
භාණ්ඩාගාර බිල්පත්	(463,648.94)	(463,648.94)
ස්ථාවර තැන්පත් රඳවාගැනීමේ බද්ද	11,650.68	11,650.68
අදාල වර්ෂය සඳහා අතිරික්තය	52,006,537.33	52,006,537.33
2017.12.31 දිනට ශේෂය	356,555,051.87	356,555,051.87

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
මූල්‍ය ප්‍රකාශන සටහන්
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා

1. ආයතනික තොරතුරු

1.1සාමාන්‍ය

මෙම සභාව ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයක් වන අතර 1998 අංක 5 දරන මෝටර් වාහන (සංශෝධන) පනත මගින් ස්ථාපනය කරන ලදී. සභාවේ කටයුතු සිදුකිරීම සඳහා රෙගුලාසි මගින් 213(අ), 213(ආ) වශයෙන් අතිරේක නව වගන්තීන් හඳුන්වා දෙන ලදි. සභාවේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 10, සී.ආර්. විජේවර්ධන මාවතේ අංක 01 දරන ස්ථානයේ පිහිටි ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ පිහිටා තිබේ.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

2.1.සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.1. සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත්කර තිබෙන මෙම මූල්‍ය ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නියම කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම යටතේ සකස් කර තිබේ.

2.1.2. අනුකූලතා ප්‍රකාශය

2018දෙසැම්බර් 31 වන විට සහ ඉන් අවසන්වන වර්ෂය සඳහා සභාවේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් (මූල්‍ය ප්‍රකාශන) ඇතුලු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සමකොටස්වල සහ මුදල් ප්‍රවාහවල වෙනස්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයෙන් ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවේ.

2.2.වත්කම් සහ වත්කම් අගය කිරීමේ පදනම්

2.2.1. දේපොළ, පිරියත උපකරණ

(අ) සමුච්චිත ක්ෂය අඩුකළ පසු දේපොළ, පිරියත සහ උපකරණ වල අගය වාර්තාකරනු ඇත.

(ආ) ක්ෂයවීම

සරල මාර්ග ක්‍රමය භාවිතා කර ක්ෂයවීම සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ. සමානුපාතිකව මිළ දී ගත් දිනයේ සිට වත්කමෙහි ඵලදායී ජීව කාලය පදනම් කර ගෙන ප්‍රතිපත්තිය යොදාගන්නා ලදී.

යොදාගන්නා ලද වාර්ෂික ක්ෂය අනුපාතයන් පහත පරිදි වේ.

1.	පරිගණක	-	25%
2.	ගෘහ භාණ්ඩ සහ සවි කිරීම්	-	10%
3.	යන්ත්‍ර සහ වෙනත් ඉදිකිරීම්	-	12.5%

සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර වත්කම් කිහිපයක් අත්පත් කර ගැනීමක් සිදුකළ අතර ස්ථාවර වත්කමේ ඉවත් කිරීම් කිසිවක් සිදු නොකරන ලදී.

2.3. ආයෝජන

මාසික පදනම මත රක්ෂණ සමාගම් වලින් මාර්ග ආරක්ෂක අරමුදලට දායකත්වය ලැබෙන අතර අතිරේක අරමුදල් භාණ්ඩාගාර බිල්පත් සහ ලංකා බැංකුවේ ස්ථාවර තැන්පත්වල ආයෝජනය කරනු ලැබේ.

(අ) ජංගම ආයෝජන

පිරිවැය විධිවිධානයෙහි සඳහන් ජංගම ආයෝජන වටිනාකම පහත වැටීම සඳහා ගණනය කරනු නොලබන අතර භාණ්ඩාගාර බිල්පත් වලින් ලැබෙන පොළී ආදායම කල්පිරීමේ දී ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ.

2.4.වගකීම් සහ විධිවිධාන

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ජංගම වගකීම් යටතේ සඳහන් වගකීම් මූල්‍ය තත්ත්ව දිනයේ සිට වසර එකක කාලය තුළ නියමිත පරිදි අවසන් වන බව අපේක්ෂා කෙරේ.

2.4.1. වෙනත් ගෙවියයුතු දේ

ණයකරුවන් සහවෙනත් ගෙවියයුතු දේ ඔවුන්ගේ පොත් අගයට දක්වා තිබේ.

2.4.2. ප්‍රතිපාදන

පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් සභාවට යම් බැඳීමක් පවතින විට හා ප්‍රතිපාදන හඳුනා ගැනෙන අතර එහි දී වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත්ව සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි අතර, වගකීමේ ප්‍රමාණයෙන් විශ්වාසදායී ඇස්තමේන්තුවක් සිදුකළ හැකි නම් ප්‍රතිපාදන වෙන් කරනු ලබයි.

2.5.මාර්ග ආරක්ෂක අරමුදලේ ආදායම

ලියාපදිංචි රක්ෂණ සමාගම් දාහතරක් විසින් සිය රක්ෂණ ඔප්පුවල තෙවන පාර්ෂව රක්ෂණ වාරික වලින් 1% කින් දායකත්වය ලබා දෙනු ලැබේ. ඊළඟ මාසයේ 15 දිනට පෙර ඔවුන් විසින් සිය මාසික දායකත්ව මුදල් ගෙවිය යුතුය.

2.6.කාර්ය මණ්ඩලය

සභාවේ අනුමැතිය ඇතිව කොන්ත්‍රාත් පදනම මත සම්බන්ධීකාරකයෙකු පත්කර තිබේ. ඔහුගේ දීමනාව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුදල් වලින් ගෙවනුලැබේ. ගණකාධිකාරීවරයෙකු සහ ගණකාධිකාරවරයෙකුගෙන් සමන්විත වෙනත් සහායක කාර්ය මණ්ඩලයක් ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ සිට මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත මාරු කර යවන ලදී. අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ වැටුප් ගෙවනු ලබන්නේ ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශය විසිනි.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

<u>රක්ෂණ සමාගම් වලින් ලැබුණු දායකත්වය -2018</u>

රක්ෂණ සමාගමේ නම	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්.	ඔක්.	නොවැ.	දෙසැ.	එකතුව
එච්එන්බී ජෙනරල් රක්ෂණ සමාගම	75,025.00	69,725.00	78,660.00	95,880.00	66,570.00	84,160.00	81,875.00	86,800.00	93,040.00	71,610.00	81,120.00	75,890.00	960,355.00
අමන ටකාෆුල් ලිමිටඩ්	127,571.25	139,895.61	146,357.47	160,340.30	117,117.66	126,834.43	170,862.15	180,217.42	174,322.45	158,919.06	175,616.36	159,414.48	1,837,468.64
සෙලින්කෝ ජෙනරල් රක්ෂණ සමාගම ඩ	396,594.00	414,631.00	386,156.00	441,689.37	405,445.00	397,210.00	406,884.81	451,724.75	445,369.67	386,870.04	406,178.70	385,754.22	4,924,507.56
ජනශක්ති රක්ෂණ සමාගම	343,950.00	329,770.00	319,515.00	395,702.00	273,655.00	271,628.00	262,250.00	264,208.00	264,085.00	-	-	-	2,724,763.00
කෝපරේටිව් රක්ෂණ සමාගම	242,046.87	263,035.31	242,720.15	267,370.92	241,923.78	244,515.53	246,827.71	285,570.81	292,582.96	261,306.60	290,426.08	287,658.63	3,165,985.35
ඔරියන්ට් රක්ෂණ සමාගම	57,690.00	83,145.00	87,125.00	87,275.00	72,005.00	78,795.00	69,025.00	91,125.00	90,920.00	81,435.00	102,270.00	86,320.00	987,130.00
සණස රක්ෂණ සමාගම	53,549.52	66,127.10	61,895.21	69,631.43	66,041.36	67,953.18	62,912.44	72,279.78	75,725.36	77,702.17	86,710.12	83,158.07	843,685.74
අලයන්ස් රක්ෂණ සමාගම	72,050.00	79,565.00	82,395.00	84,575.00	77,910.00	79,790.00	84,035.00	90,135.00	70,195.00	314,523.00	362,188.00	318,855.00	1,716,216.00
ශ්‍රී ලංකා රක්ෂණ සමාගම	867,541.38	859,123.13	859,386.15	937,406.15	813,422.72	918,874.03	844,658.65	973,223.26	949,987.31	883,569.25	926,016.39	859,411.51	10,692,619.93
පීපල්ස් ඉන්ෂුවරන්ස් පිඑල්සී	135,235.91	133,108.44	121,375.91	145,953.53	116,464.86	123,987.00	140,225.01	152,852.61	163,529.64	166,464.54	161,230.28	154,865.05	1,715,292.78
කොන්ටිනෙන්ටල් රක්ෂණ සමාගම	101,879.00	99,993.75	113,938.00	139,092.00	106,488.00	113,882.00	110,692.00	122,918.00	122,236.00	115,372.00	122,569.00	107,341.00	1,376,400.75
එල්ඕඑල්සී රක්ෂණ සමාගම	84,865.00	360,150.00	244,450.00	234,495.00	231,770.00	257,975.00	273,465.00	278,795.00	276,440.00	267,335.00	300,890.00	254,185.00	3,064,815.00
නැෂනල් රක්ෂණ ට්‍රස්ට් ෆන්ඩ්	42,359.55	35,891.40	87,111.75	67,824.15	23,792.40	26,300.85	17,665.30	19,376.75	19,232.25	15,481.65	22,885.05	27,267.40	405,188.50
ෆෙයාර් ෆස්ට් රක්ෂණ සමාගම	708,165.00	661,790.00	715,235.00	891,970.00	702,325.00	906,850.00	797,785.00	858,370.00	941,865.00	886,880.00	966,575.00	844,665.00	9,882,475.00
මුලු ගණන	3,308,522.48	3,595,950.74	3,546,320.64	4,019,204.85	3,314,930.78	3,698,755.02	3,569,163.07	3,927,596.38	3,979,530.64	3,687,468.31	4,004,674.98	3,644,785.36	44,296,903.25

<u>2018 වර්ෂය සඳහා රක්ෂණ දායකත්වය</u>

	2018 රු	2017 රු
වර්ෂය තුළ ලැබුණු රක්ෂණ	44,296,903.25	41,958,494.59
එකතු කිරීම		
2018.12.31 දිනට ලැබිය යුතු රක්ෂණ	3,397,889.23	3,308,522.48
	47,694,792.48	45,267,017.07
අඩු කිරීම		
2017.12.31 දිනට ලැබිය යුතු රක්ෂණ	3,308,522.48	3,262,737.91
	44,386,270.00	**42,004,279.16**

සටහන 02
වෙනත් ආදායම්

	2018	2017
	රු	රු
භාණ්ඩාගාර බිල්පත් පොළිය	19,595,333.31	19,161,899.28
ස්ථාවර තැන්පතු පොළී	2,029,240.84	1,405,613.70
භාණ්ඩාගාර බිල්පත් ගැලපුම් ආදායම	11.99	4.03
වෙනත් ආදායම්		203,808.00
	21,624,586.14	**20,771,325.01**

සටහන -03

භාණ්ඩාගාර බිල්පත් පොළිය

විස්තරය (බිල්පත් අංකය)	1 රු	2 රු	3 රු	4 රු	5 රු	5 A රු	6 රු	7 රු	8 රු	09 රු	10 රු	11 රු		එකතුව
2018/01/01 දිනට ආරම්භක ශේෂය	9,803,190.17	33,524,056.70	5,869,827.35	8,618,790.30	15,150,884.90	620,265.02	23,574,260.27	11,245,210.10	7,483,956.19	76,974,335.43	23,552,522.36	-	-	173,090,051.92
වර්ෂය තුළ	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
2018 වර්ෂය සඳහා පොළිය	830,516.03	2,916,040.67	497,285.40	731,761.23	1,455,314.79	59,716,76	2,073,399.98	925,821.64	680,308.79	7,342,918.45	2,073,210.05	5,697.96	3,341.56	19,595,333.31
ආපසු ගැනීම්	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
2018/12/31 දිනට ශේෂය	10,633,706.20	36,440,097.37	6,367,112.75	9,350,551.53	16,606,199.69	697,981.78	25,647,660.25	12,171,031.74	8,164,264.98	84,317,253.88	25,625,732.41	5,697.96	3,341.56	192,685,385.23
වටයන ලද අගය	(2.99)	(0.79)	(2.01)	(3.11)	(0.94)	(0.10)			(1.18)	(0.41)		(0.35)	(0.11)	(11.99)
														192,685,373.24

බිල් පත් අංකය	පොළි ආදායම
1	830,516.03
2	2,916,040.67
3	497,285.40
4	731,761.23
5	1,455,314.79
5A	59,716,76
6	2,073,399.98
7	925,821.64
8	680,308.79
9	7,342,918.45
10	2,073,210.05
11	5,697.96
12	3,341.56
එකතුව	**19,595,333.31**

සටහන - 04

වියදම්

	2018 රු	2017 රු
දීමනා	1,977,450.24	1,877,239.56
වාහන සඳහා ඉන්ධන	649,104.76	607,250.62
සභාවේ සාමාජිකයින්ගේ ගාස්තු	74,500.00	78,000.00
වන්දි (හප්පා පළා යාම)	5,200,000.00	8,200,000.00
අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම	1,452,571.39	792,406.45
වාහන නඩත්තුව	1,232,884.50	427,900.90
ලිපි ද්‍රව්‍ය වියදම්	354,246.64	330,739.62
දුරකතන ගාස්තු	152,504.40	160,256.31
පුවත් පත්	108,800.00	115,970.00
මුද්‍රණය හා භාෂා පරිවර්තනය	178,103.50	113,713.84
අතිකාල අයකිරීම්	248,304.96	273,243.57
දැන්වීම්කරණය ප්‍රචාරණය	619,097.00	4,100,829.00
රැස්වීම් සඳහා සංග්‍රහ	322,963,81	243,154.81
විගණන ගාස්තු	238,260.00	52,000.00
ගමනාගමන වියදම්	118,793.25	82,007,50
සුළු වියදම්	21,518.00	2,350.00
ක්ෂයවීම්	418,283.75	316,075.58
නවාතැන්	78,680.00	30,600.00
තැපැල්	2,422.00	502.50
ස්ථාවර තැන්පත් පොළී	7,419.61	11,650.68
භාණ්ඩ නිදහස් කිරීම	521,011.00	-
ආදායම් බදු	14,400.00	-
කාර්ය මණ්ඩල පුහුණු	13,000.00	-
	14,004,318.81	**15,331,400.76**

සටහන - 05

දේපොළ, පිරියත හා උපකරණ

	පුද්ගල පරිගණක	ලැප්ටොප්	ඡායා පිටපත් යන්ත්‍ර	පරිගණක මුද්‍රණ යන්ත්‍ර	ෆැක්ස් යන්ත්‍ර	ගෘහ භාණ්ඩ හා සවිකෘත	වායු සමීකරණ යන්ත්‍ර	ඩීවීඩී ප්ලේයර්	එල්සීඩී රූපවාහිනිය 42“	නිශ්චල කැමරාව	හඬ සටහුව	බහුමාධ්‍ය තිරය	වයර් කෝඩය	වයිට් බෝඩ්
පිරිවැය	රු	රු	රු	රු	රු	රු	රු	රු	රු	රු	රු	රු	රු	රු
2018/01/01 වනවිට ශේෂය	545,100.00	168,400.00	75,000.00	41,300.00	24,400.00	641,500.00	139,800.00	4,100.00	62,000.00	100,000.00	8,200.00	8,000.00	1,400.00	6,000.00
වර්ෂය තුළ	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
ආකලන	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
බැහැර කිරීම්	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
2018.12.31 වන විට ශේෂය	545,100.00	168,400.00	75,000.00	41,300.00	24,400.00	641,500.00	139,800.00	4,100.00	62,000.00	100,000.00	8,200.00	8,000.00	1,400.00	6,000.00
එකතුකළ ක්ෂය වීම	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
2018.01.01 වනවිට ශේෂය	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
වර්ෂය සඳහා අය කිරීම	136,275.00	42,100.00	9,375.00	5,162.50	3,050.00	128,300.00	17,475.00	512.50	7,750.00	12,500.00	1,025.00	1,000.00	1,400.00	750.00
2018.12.31 වන දිනට ශේෂය	136,275.00	42,100.00	9,375.00	5,162.50	3,050.00	128,300.00	17,475.00	512.50	7,750.00	12,500.00	1,025.00	1,000.00	1,400.00	750.00
ශුද්ධ පොත් අගය	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
2017/12/31 වන විට	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
2018/12/31 වන විට	408,825.00	126,300.00	65,625.00	36,137.50	21,350.00	513,200.00	122,325.00	3,587.50	54,250.00	87,500.00	7,175.00	7,000.00	-	5,250.00

සටහන් 05

දේපොළ, පිරියත සහ උපකරණ

	බහුමාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍රය	ඉන්ටර්කොම්	මස්තක ප්‍රක්ෂේපක	වෙනත්	එකතුව
පිරිවැය	රු	රු	රු	රු	රු
2018/01/01 වනවිට ශේෂය	35,000.00	25,250.00	320,000.00	8,120.00	2,238,070.00
වර්ෂය තුළ					
ආකලන					
බැහැර කිරීම්					
2018.12.31 වන විට ශේෂය	35,000.00	25,250.00	320,000.00	8,120.00	2,238,070.00
එකතුකළ ක්ෂය වීම					
2018.01.01 වනවිට ශේෂය	-	-	-	-	-
වර්ෂය සඳහා අය කිරීම	4,375.00	3,156.25	40,000.00	1,015.00	418,283.75
2018.12.31 වන විට ශේෂය	4,375.00	3,156.25	40,000.00	1,015.00	418,283.75
ශුද්ධ පොත් අගය	-	-	-	-	-
2017/12/31 වන විට	-	-	-	-	-
2018/12/31 වන විට	30,625.00	22,093.75	280,000.00	7,105.00	1,819,786.25

සටහන - 06

	2018	**2017**
<u>බැංකුවේ තිබෙන මුදල</u>	රු	රු
<u>ගිණුම් අංකය 23276666605</u>	31,818,550.63	69,035,765.37

2018 දෙසැම්බර් 31 වන විට ශේෂ පිරික්සුම (ගලපන ලද)

වත්කම්	හර	බැර
පරිගණක උපකාරක (උපාංග)	545,100.00	
ලැප්ටොප්	168,400.00	
ඡායා පිටපත් යන්ත්‍ර	75,000.00	
මුද්‍රණ යන්ත්‍ර	41,300.00	
ෆැක්ස් යන්ත්‍ර	24,400.00	
ගෘහ භාණ්ඩ හා සවිකෘත	641,500.00	
වායුසමීකරණ යන්ත්‍රය	139,800.00	
ඩීවීඩී ප්ලේයර්	4,100.00	
42“ එල්ඊඩී රූපවාහිනිය	62,000.00	
නිශ්චල කැමරා	100,000.00	
හඬ සටහුව	8,200.00	
බහුමාධ්‍ය තිර	8,000.00	
වයර් කෝඩ්	1,400.00	
වයිට් බෝඩ්	6,000.00	
ස්කෑනර්	24,500.00	
බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ	35,000.00	
ඉන්ටර්කොම්	25,250.00	
වෙනත්	8,120.00	
ඕවර් හෙඩ් ප්‍රොජෙක්ටර්	320,000.00	
සමුච්චිත ක්ෂයවීම		
පරිගණක උපකාරක (උපාංග)		136,275.00
ලැප්ටොප්		42,100.00
ඡායා පිටපත් යන්ත්‍ර		9,375.00
මුද්‍රණ යන්ත්‍ර		5,162.50
ෆැක්ස් යන්ත්‍ර		3,050.00
ගෘහ භාණ්ඩ හා සවිකෘත		128,300.00
වායුසමීකරණ යන්ත්‍රය		17,475.00
ඩීවීඩී ප්ලේයර්		512.50
42“ එල්ඊඩී රූපවාහිනිය		7,750.00
නිශ්චල කැමරා		12,500.00
හඬ සටහුව		1,025.00
බහුමාධ්‍ය තිර		1,000.00
වයර් කෝඩ්		1,400.00
වයිට් බෝඩ්		750.00
ස්කෑනර්		3,062.50
බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ		4,375.00
ඉන්ටර්කොම්		3,156.25
වෙනත්		1,015.00
ඕවර් හෙඩ් ප්‍රොජෙක්ටර්		40,000.00
ස්ථාවර තැන්පතු	84,000,000.00	
භාණ්ඩාගාර බිල්පත් ගැලපුම් ආදායම ගිණුම		11.99
භාණ්ඩාගාර බිල්පත්	235,548,983.16	
භාණ්ඩාගාර බිල්පත් පොලී ගිණුම		19,595,333.31
රක්ෂණ සමාගම් වලින් ලැබීම	3,97,889.23	
අරමුදල් ගිණුම		304,548,514.54
රක්ෂණ සමාගම් වලින් දායකත්වය		44,386,270.00
ස්ථාවර තැන්පත් පොළී ගිණුම		2,029,240.84
ස්ථාවර තැන්පත් පොළී ලැබීම් ගිණුම	140,972.60	
විගණන ගාස්තු ගෙවියයුතු		171,130.00
වාහන සඳහා ඉන්ධන	649,104.76	
සභා උපදේශක ගාස්තු	74,500.00	
සභා සාමාජික දීමනා	1,977,450.24	
චන්දි	5,200,000.00	
අලුත්වැඩිය සහ නඩත්තු	1,452,571.39	
වාහන නඩත්තු	1,232,884.50	
ක්ෂයවීම්	418,283.75	
ලිපිද්‍රව්‍ය වියදම්	354,246.64	
දුරකතන අයකිරීම්	152,504.40	
පුවත්පත්	108,800.00	
මුද්‍රණය සහ පරිවර්තනය	178,103.50	
අතිකාල ගාස්තු	248,304.96	
දැන්වීමකරණය සහ ප්‍රචාරණය	619,097.00	
රැස්වීම්වල දී සංග්‍රහ	322,963.81	
ගමනාගමන වියදම්	118,793.25	
සුළු වියදම්	21,518.00	
බැංකු ශේෂය	31,818,550.63	
නවාතැන්	78,680.00	
කැපැල්	2,422.00	
කාර්ය මණ්ඩල පුහුණු	13,000.00	
ආදායම් බදු	14,400.00	
නිෂ්කාශන ගාස්තු	521,011.00	
ස්ථාවර තැන්පත් රඳවා ගැනීමේ බදු	7,419.61	
විගණන ගාස්තු ගිණුම	238,260.00	
	371,148,784.43	**371,148,784.43**

J1	ස්ථාවර තැන්පත් පොළී ගිණුම (ඩී ආර්)	104,856.16	
	ස්ථාවර තැන්පත් පොළී අයවිය යුතු ගිණුම		104,856.16
	(පසුගිය වසර සඳහා ලැබියයුතු ස්ථාවර තැන්පත්		
	පොළී ගිණුම් ගැලපුම් කරන ලදුව)		
J2	භාණ්ඩාගාර බිල්පත් ගිණුම් (ඩීආර්)	19,595,345.30	
	භාණ්ඩාගාර බිල්පත් ගැලපුම් ආදායම් ගිණුම		11.99
	භාණ්ඩාගාර බිල්පත් පොලී ගිණුම්		19,595,333.31
	(2017.12.31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා		
	භාණ්ඩාගාර බිල්පත් පොලිය ප්‍රාග්ධනීකරණයෙන් පසු)		
J3	රක්ෂණ සමාගම් වලින් දායකත්වය (ඩීආර්)	3,308,522.48	
	රක්ෂණ සමාගම් වලින් අයවිය යුතු		3,308,522.48
	(පසුගිය වසර සඳහා ගැලපුම් කිරීමෙන් පසු		
	රක්ෂණ සමාගම් වලින් අයවිය යුතු)		
J4	රක්ෂණ සමාගම් වලින් අයවිය යුතු (ඩීආර්)	3,397,889.23	
	රක්ෂණ සමාගම් වලින් දායකත්වය		3,397,889.23
	(2018.12.31 න් අවසන් වන වර්ෂය සඳහා රක්ෂණ සමාගම් වලින් අයවිය යුතු මුදල් සඳහා ගැලපුම් කිරීමෙන් පසු)		
J5	ස්ථාවර තැන්පත් පොළී අයවිය යුතු ගිණුම	140,972.60	
	ස්ථාවර තැන්පත් පොළී රඳවා ගැනීමේ බදු ගිණුම	7,419.61	
	ස්ථාවර තැන්පත් පොළී ගිණුම		148,392.21
	(2018.12.31 න් අවසන්වන වර්ෂය සඳහා අයවිය යුතු ස්ථාවර තැන්පත් පොළී වෙනුවෙන් ගැලපීම් කිරීමෙන් පසු)		
J6	විගණන ගාස්තු ගිණුම	67,130.00	
	විගණන ගාස්තු අයවිය යුතු ගිණුම්		67,130.00
J7	අරමුදල් ගිණුම (ඩීආර්)	463,648.94	
	භාණ්ඩාගාර බිල්පත් ගිණුම		463,648.94
	(2017 වර්ෂය සඳහා භාණ්ඩාගාර බිල්පත්වල ආරම්භක ශේෂයෙන් රු. 463,648.94 ක වැඩිපුර කරන ලද වෙන්කිරීම නිවැරදි කිරීම))		
J8	ස්ථාවර තැන්පත් පොළී ගිණුම (ඩී ආර්)	11,650.68	
	අරමුදල් ගිණුම		11,650.68
	2017 වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු රඳවා ගැනීමේ බද්දෙහි ගැලපුම් නිවැරදි කිරීම)		
J9	ක්ෂයවීම (ඩීආර්)	418,283.75	
	ක්ෂයවීම සඳහා ප්‍රතිපාදන		
	පරිගණක		136,275.00
	ලැප්ටොප්		42,100.00
	ඡායා පිටපත් යන්ත්‍ර		9,375.00
	මුද්‍රණ යන්ත්‍ර		5,162.50
	ෆැක්ස් යන්ත්‍ර		3,050.00
	ගෘහ භාණ්ඩ සහ සවිකෘත		128,300.00
	වායු සමීකරණ		17,475.00
	ඩීවීඩී ප්ලේයර්		512.50
	එල්ඊඩී රූපවාහිනී		7,750.00
	බහුමාධ්‍ය තිරය		1,000.00
	නිශ්චල කැමරා		12,500.00
	හඬ සැටහුම		1,025.00
	වයර් කෝඩය		1,400.00
	වයිට් බෝඩය		750.00
	ස්කෑනර් යන්ත්‍රය		3,062.50
	මල්ටි මීඩියා ප්‍රක්ෂේපණ යන්ත්‍රය		4,375.00
	ඉන්ටර්කොම්		3,156.25
	ඕවර් හෙඩ් ප්‍රක්ශේපණ යන්ත්‍ර		40,000.00
	වෙනත්		1,015.00
	(2018.12.31 දිනෙන් අවසන්වන වර්ෂය වෙනුවෙන් ක්ෂයවීම් ගැලපීම සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසු)		

ක්ෂයවීම

දේපළ, පිරියත සහ උපකරණ

	පුද්ගල පරිගණක	ලැප්ටොප්	ඡායා පිටපත් යන්ත්‍ර	පරිගණක මුද්‍රණ යන්ත්‍ර	ෆැක්ස් යන්ත්‍ර	ගෘහ භාණ්ඩ හා සවිකෘත	වායු සමීකරණ යන්ත්‍ර	ඩීවීඩී ප්ලේයර්	එල්සීඩී රූපවාහිනිය 42“	නිශ්චල කැමරාව	හඬ සටහුව
පිරිවැය	රු	රු	රු	රු	රු	රු	රු	රු	රු	රු	රු
2018/01/01 වනවිට ශේෂය	545,100.00	168,400.00	75,000.00	41,300.00	24,400.00	641,500.00	139,800.00	4,100.00	62,000.00	100,000.00	8,200.00
ක්ෂයවීම											
ප්‍රතිශතය	25%	25%	12.5%	12.5%	12.5%	20%	12.5%	12.5%	12.5%	12.5%	12.5%
ක්ෂයවීම (1 වන වසර)	136,275,00	42,100.00	9,375.00	5,162.50	3,050.00	128,300.00	17,475.00	512.50	7,750.00	12,500.00	1,025.00

	බහුමාධ්‍ය තිරය	වයර් කෝඩය	වයිට් බෝඩ්	ස්කෑනර්	බහුමාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍රය	ඉන්ට ර්කොම්	මස්තක ප්‍රක්ෂේපක	වෙනත්	එකතුව
පිරිවැය	රු	රු	රු	රු		රු	රු	රු	රු
2018/01/01 වනවිට ශේෂය	8,000.00	1,4000.00	6,000.00	24,500.00	35,000.00	25,250.00	320,000.00	8,120.00	2,238,070.00
ක්ෂයවීම									
ප්‍රතිශතය	12.5%	100%	12.5%	12.5%	12.5%	12.5%	12.5%	12.5%	
ක්ෂයවීම (1 වන වසර)	1,000.00	1,400.00	750.00	3,062.50	4,375.00	3,156.25	40,000.00	1,015.00	418,283.75

2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම (ගැලපීමට පෙර)

වත්කම්	හර	බැර
පරිගණක උපකාරක (උපාංග)	545,100.00	
ලැප්ටොප්	168,400.00	
ඡායා පිටපත් යන්ත්‍ර	75,000.00	
මුද්‍රණ යන්ත්‍ර	41,300.00	
ෆැක්ස් යන්ත්‍ර	24,400.00	
ගෘහ භාණ්ඩ හා සවිකෘත	641,500.00	
වායුසමීකරණ යන්ත්‍රය	139,800.00	
ඩීවීඩී ප්ලේයර්	4,100.00	
42“ එල්ඊඩී රූපවාහිනිය	62,000.00	
නිශ්චල කැමරා	100,000.00	
හඬ සටහුව	8,200.00	
බහුමාධ්‍ය තිර	8,000.00	
වයර් කෝඩ්	1,400.00	
වයිට් බෝඩ්	6,000.00	
ස්කෑනර්	24,500.00	
බහු මාධ්‍ය ප්‍රක්ශේපණ	35,000.00	
ඉන්ටර්කොම්	25,250.00	
වෙනත්	8,120.00	
ඕවර් හෙඩ් ප්‍රොජෙක්ටර්	320,000.00	
සමුච්චිත ක්ෂයවීම		
පරිගණක උපකාරක (උපාංග)		
ලැප්ටොප්		
ඡායා පිටපත් යන්ත්‍ර		
මුද්‍රණ යන්ත්‍ර		
ෆැක්ස් යන්ත්‍ර		
ගෘහ භාණ්ඩ හා සවිකෘත		
වායුසමීකරණ යන්ත්‍රය		
ජංගම දුරකතන		
ඩීවීඩී ප්ලේයර්		
42“ එල්ඊඩී රූපවාහිනිය		
ගොඩනැගිලි සහ ව්‍යුහ		
නිශ්චල කැමරා		
හඬ සටහුව		
ඕවර් හෙඩ් ප්‍රොජෙක්ටර්		
ස්ථාවර තැන්පතු	84,000,000.00	
භාණ්ඩාගාර බිල්පත්		11.99
භාණ්ඩාගාර බිල්පත් ගැලපුම් ආදායම ගිණුම	216,417,298.79	
රක්ෂණ සමාගම් වලින් ලැබීම්	3,308,522.48	
අරමුදල් ගිණුම		305,000,512.80
රක්ෂණ සමාගම් වලින් දායකත්වය		44,296,903.25
ස්ථාවර තැන්පත් පොළී ගිණුම		1,997,355.47
ස්ථාවර තැන්පත් පොළී ලැබිය යුතු ගිණුම	104,856.16	
විගණන ගාස්තු ගෙවියයුතු		104,000.00
වාහන සඳහා ඉන්ධන	649,104.76	
සභා උපදේශක ගාස්තු	74,500.00	
සභා සාමාජික දීමනා	1,977,450.24	
චන්දි	5,200,000.00	
අලුත්වැඩිය සහ නඩත්තු	1,452,571.39	
වාහන නඩත්තු	1,232,884.50	
ලිපිද්‍රව්‍ය වියදම්	354,246.64	
දුරකතන අයකිරීම්	152,504.40	
පුවත්පත්	108,800.00	
මුද්‍රණය සහ පරිවර්තනය	178,103.50	
අතිකාල ගාස්තු	248,304.96	
දැන්වීම්කරණය සහ ප්‍රචාරණය	619,097.00	
රැස්වීම්වල දී සංග්‍රහ	322,963.81	
ගමනාගමන වියදම්	118,793.25	
සුළු වියදම්	21,518.00	
බැංකු ශේෂය	31,818,550.63	
නවාතැන්	78,680.00	
තැපැල්	2,422.00	
කාර්ය මණ්ඩල පුහුණු	13,000.00	
ආදායම් බදු	14,400.00	
නිෂ්කාශන ගාස්තු	521,011.00	
විගණන ගාස්තු	171,130.00	
	351,398,783.51	**351,398,783.51**

විගණකාධිපති වාර්තාව - 2018

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } CTP/B/NCRS/01/FA/18 මගේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2019 ජූලි 03 දින

සභාපති,

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 57 වගන්තිය ප්‍රකාරව හා සභාවේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව ජංගම නොවන වත්කම් භාවිතයට ගත හැකි දිනයේ සිට ක්ෂය කළ යුතු වුවත් 2018 දෙසැම්බර් 12 දින ජපන් රජයෙන් පරිත්‍යාග වශයෙන් ලද වටිනාකම රු.15,000,000 ක රියදුරු පුහුණු උපකරණ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණු අතර එයට අදාළ රු. 97,603 ක ක්ෂය වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර බිල්පත් සඳහා පෙර වර්ෂයට අදාළව ලැබී තිබුණු රු. 4,128,270 ක පොළී ආදායම අතීතානුයෝගීව පෙර වර්ෂයේ අතිරික්තයට ගැලපීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) මුහුණත වටිනාකම රු. 104,742 ක් වූ භාණ්ඩාගාර බිල්පත් ගිණුම් ගත කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය

කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව,මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර,විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ, ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාව හා සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 754	2018 වර්ෂයේ ඉන්වෙන්ට්‍රි ලේඛණ යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ආ)	1971 අංක 38 දරන මුදල් පනතේ 8 (1) වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.4 වගන්තිය.	මුදල් වර්ෂය ආරම්භවීමට මාස 03 කට පෙර සභාව විසින් අයවැය ලේඛණය අනුමත කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය සඳහා සභා අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ඇ)	2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 වගන්තිය.	ආයතනයේ සභා රැස්වීම් වලදී කාර්යසාධනය පිළිබඳව ඇගයීමක් කළ යුතු වුවද, පවත්වන ලද සභා රැස්වීම් වලදී එපරිදි ක්‍රියාකර නොතිබුණි.
(ඈ)	2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 (ඇ) වගන්තිය.	සභාවේ සංවිධාන ව්‍යුහය හා අනුමත කාර්ය මණ්ඩලය, භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි.
(ඉ)	2005 ජනවාරි 27 දිනැති අංක පීඊඩී/27 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය.	මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සභාව ආරම්භයේ සිටම කිසිදු වර්ෂයක් සඳහා වාර්ෂික වාර්තා පිළියෙල කර නොතිබුණි.
(ඊ)	2010 දෙසැම්බර් 14 දිනැති අංක පීඊඩී/55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	වර්ෂයකට අවම වශයෙන් විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් වාර 04 ක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ රැස්වීම් වාර 01 ක් පමණක් පවත්වා තිබුණි.

(උ)	2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 (ආ) ඡේදය	ක්‍රියාකාරී සැලැස්ම වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ යුතු අතර, ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම/ප්‍රතිඵල දැක්විය යුතුය. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුමත නොවූ අයවැය ඇස්තමේන්තු පදනම් කරගෙන පිළියෙල කර තිබුණු අතර, ක්‍රියාකාරකම්වල අපේක්ෂිත ප්‍රතිඵලද දක්වා නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

  මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව පිහිටුවා වසර 21 ක් ගත වී ඇතත් 1998 අංක 05 දරන පනතින් (සංශෝධිත) මෝටර් වාහන පනතේ දැක්වෙන ප්‍රධාන අරමුණුවලට අදාළ කාර්යයන් වන, සෑම වසරකම මාර්ග ජාලයට අලුතින් එකතු වන මාර්ග සම්බන්ධව හා රථ වාහන ප්‍රමාණය මාර්ග අනතුරු, දේපල හානි හා සම්බන්ධ සියළු තොරතුරු ඇතුලත් පරිගණක දත්ත ගබඩාවක් පවත්වා ගෙන යාම, සම්බන්ධිත විෂයයන් පිළිබඳ තොරතුරු රැස්කිරීම, පර්යේෂණ පැවැත්වීම, ක්ෂේත්‍ර පරීක්ෂණ පැවත්වීම සහ ආධාර කිරීම, මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති පිළිබඳ රජයට උපදෙස් දීම, මාර්ග ආරක්ෂාව පිළිබඳ කටයුතු සඳහා මූල්‍යමය හා වෙනත් සහාය ලබාදීම හා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන තුල මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත කාර්යය සම්බන්ධීකරණය කිරීම යන කාර්යයන් ඉටුකර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර සභාවේ සම්පත් සැකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

  (අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 (ඉ) වගන්තිය ප්‍රකාර ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

  (ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14 ඡේදය ප්‍රකාරව රු. 200,000 කට වැඩි වාහන අළුත්වැඩියා සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් නිල වාහනයක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී දරන ලද රු. 821,593 ක වියදම් සඳහා එසේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

03. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව කොමිෂමක් බවට පත් කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන සකස් කිරීම, 2010 වර්ෂයේ සිටම සැලැසුම් කර තිබුණු නමුත් එම කාර්යය සමාලෝචිත වර්ෂයේදී ද අවසන් කර නොතිබුණි.

(ආ) 2005 වර්ෂයේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව පිහිටුවීමේ ප්‍රධාන අරමුණු පාදක කරගෙන 2010 – 2017 කාල පරාසයට අදාළ හා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබුණු ව්‍යාපෘති 09 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. එසේම කාර්යසාධන නිර්ණායකයක් ලෙස ජාතික මට්ටමේ ක්‍රියාත්මක වන පුහුණු කිරීමේ නිවාරණ කාර්යයන් සම්බන්ධ දැනුවත් කිරීමේ ව්‍යාපෘති රාශියක් හැඳිනගෙන තිබුණ ද ඒ ඒ පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකයින් මූලිකවම හඳුනාගෙන නොතිබීම නිසා වැඩසටහන්වල ඵලදායීතාවය අවම මට්ටමක පැවතුණි.

(ඇ) මාර්ග අනතුරු පිළිබඳ දත්ත විග්‍රහයන්ට අනුව සමාලෝචිත වර්ෂයේ දුම්රිය අනතුරු සංඛ්‍යාව පසුගිය වර්ෂයට සාපේක්ෂව, මාරක අනතුරු සංඛ්‍යාව 25 කින්ද, බරපතල අනතුරු සංඛ්‍යාව 331 කින්ද වර්ධනය වී තිබුණු අතර දුම්රිය හරස් මාර්ගවල සිදු වූ අනතුරු සංඛ්‍යාවද 181 කින් වර්ධනය වී තිබුණි. මෙම අනතුරු වැළක්වීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී සැලැසුම් කළ පියවරවලින් ක්‍රියාත්මක කර තිබුණේ සියයට 2.8 ක් පමණි. ඒ අනුව සභාව පිහිටුවීමේ සමාජ වගකීම නිසියාකාරව ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) 2017 වර්ෂයේ වින්දිතයින්ට වන්දි වශයෙන් රු. 8,200,000 ක් ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දී එය රු. 5,200,000 ක් වශයෙන් අඩු වී තිබුණි. අයදුම්පත්‍රවල පවත්නා අඩුපාඩු හේතුවෙන් සහා අනුමැතිය හා ස්ථාවර කමිටු අනුමැතිය ලබාදීමේ ප්‍රමාදය ගෙවීම් අඩුවීමට හේතු වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුල රු. මිලියන 66 ක ආදායම් උපයාගෙන තිබුණ ද සභාවේ ඉටුකළ යුතු කාර්යයන් සඳහා ඉන් රු. මිලියන 14 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණු අතර ආයෝජන අනුපාතය වාර්ෂිකව ඉහල මට්ටමක පැවතිය ද සභාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා එම මුදල් යොදවා නොමැති බව නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳ 1971 අංක 38 දරනමුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාරව සභාපති වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක විගණකාධිපති වාර්තාව.

නීතිරීති විධිවිධාන යොමුව

(අ) මුදල් රෙගුලාසි 754

ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධයෙන් ලේඛන ගතකර ඇති සමහර කරුණු අඩුපාඩු සහිතව සිදුව ඇති බව අවබෝධ කර ගතිමි.ඒ අනුව අදාල නිලධාරීන්ගෙන් උපදෙස් ලබා ගෙන ඉහත ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි.

(ආ) 1971 අංක 38 මුදල් පනතේ

8 (1) වගන්තිය

2018 වර්ෂයේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ මුළු ආදායම් 2017 වර්ෂයට සාපේක්ෂව 10% කින් පමණ ඉහළ යැතැයි අපේක්ෂා කළ අතර, වෙනත් ප්‍රදානයන් රුපියල් මිලියන 6 ක් වත් ලැබෙණු අතැයි අපේක්ෂා කරන ලදි. නමුත් මෙයට හේතු පාදක වූයේ තුන්වන පාර්ශවීය රක්ෂණ වටිනාකමෙන් දැනට මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවට ලැබෙනුයේ 1% ප්‍රතිශතයකි.මෙම ප්‍රතිශතය 2% දක්වා ඉහළ දැමීමට සාකච්ඡා මට්ටමේ පැවතියද පසුව එම තීරණය මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව කොමිෂමක් බවට පත් වූ පසුව ක්‍රියාත්මක කිරීමට තීරණය වූ බැවින් ඇස්තමේන්තු ගත ආදායමට ලභා වීමට නොහැකි විය.

අපේක්ෂිත වියදම මිලියන 74 සිට මිලියන 19 ක් දක්වා පහළ යෑමෙහිලා වියදමෙහි 81% කින් පරතරයක් ඇතිවීමට හේතුපාදක වන ලද්දේ වාර්ෂික සැලසුම් තුලින් විවිධ ව්‍යාපෘතීන් සඳහා වැය කිරීමට ඇස්තමේන්තු ගත කරන ලද මුදලින් ඉහළ ප්‍රතිශතයක් ඉතුරු කරගත හැකි වූයේ එම ව්‍යාපෘති සඳහා පෞද්ගලික ආයතන මගින් පූර්ව අනුග්‍රහය දැක්වූ හෙයිනි. වාර්ෂික ගැලපීමේන් 80% කට පමණ සභාව මඟින් ක්‍රියාකාරී දායකත්වය ලබා දී ඇත.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පිරිඩි/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 වගන්තිය

1998 අංක 05 දරණ මෝටර් රථ වාහන පනතට අනුවඅවම වශයෙන් වසරකට සභාවාර 04 ක් වත් පැවැත්විය යුතු ලෙස දක්වා ඇත. 2018 වසරේ සභා වාර 03 පමණක් පවත්වා ඇති අතර, වර්ෂ අවසානයේ රටේ පැවති දේශපාලන වාතාවරණය අනුව සැළසුම් කර තිබූ එක් සභා වාරයක් අවලංගු කිරීමට කටයුතු කරන ලදි. සභා රැස්වීම් සඳහා පාලක මණ්ඩලය වෙත කල් ඇතිව දැනුම් දීම සිදු කරන අතර,සභා සාමාජිකයන්ගේ පෞද්ගලික හෝ රාජකාරී හේතූන් මත සභාවාර සඳහා සහභාගී වීමට අවස්ථාව නොලැබණු ඇත. ඒ සඳහා ගතහැකි විකල්ප ක්‍රියා මාර්ගයන්ද නොමැත.

(ඈ)2003 ජුනි 02 දිනැති අංක පිරිඩි/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2(ඇ) වගන්තිය

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව කොමිෂන් සභාවක් වීමට අදාල කටයුතු මේ වන විට අවසන් අදියරේ පසුවන අතර, කොමිෂමක් ලෙස ස්ථාපිත කිරීමෙන් අනතුරුව අනුමත කාර්ය මණ්ඩලය භාණ්ඩාගාරයේ හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට කටයුතු කරමි.

(ඉ) 2005 ජනවාරි 27 දිනැති අංක පි.ඊ.ඩි/27 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය

සභාව ආරම්භයේ සිටම වාර්ෂික වාර්තා පිළියෙල කර නොතිබූ අතර, අමාත්‍යාංශයේ විගණන කළමනාකරණ කමිටු රැස්වීමේ දී මේ සම්බන්ධයෙන් ලේකම්තුමා ලබා දුන් උපදෙස් අනුව 2017 /2018 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා සැකසීමට උපදෙස් ලබා දෙන ලදි. ඒ අනුව 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අවසන් කර පරිවර්තන කටයුතු සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. 2018 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව මේ වන විට සකස් කිරීම ආරම්භ කර ඇත.

(ඊ) 2010 දෙසැම්බර් 14 දිනැති අංකපිඊඩි/55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

මෙතෙක් කාලයක් සභාව සඳහා විගණන කළමනාකරණ කමිටුවක් නොතිබුණි.ප්‍රථම වරට විගණන කළමනාකරණ කමිටුවක් ආරම්භ කරනු ලැබුයේ 2018 වසරේදී ය. එහි පළමු රැස්වීම අප්‍රියල් මස දෙවන දින පැවැත්වූ අතර, ඉන් පසු විගණන කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීමට අවස්ථාව නොලැබුණි. එයට හේතු වූයේ පත් වූ සමාජිකයන්ගෙන් එක් නිලධාරියෙකු ඉල්ලා අස්වීම හේතු කොට ගෙනය.ඉන් පසු සභා රැස්වීම් පැවැත්වූයේ 2018.11.26 දින වන අතර, ඒ වන විට පැවති දේශපාලන වාතාවරණය නිසා විෂයභාර අමාත්‍යතුමාගේ වෙනස්වීමද සිදු විය. 2019 වසරේ සිට විගණන කළමනාකරණ රැස්වීම නිසි ආකාරයෙන් පැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව කාරුණිකව දන්වමි.

(උ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 (ආ) ඡේදය.

2018 වසරේ එවැනි අඩුපාඩු සිදු වූ බව පිළිගන්නා අතර, ඉදිරියේදී මෙවන් අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමි.

- **2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර සභාවේ බලතල කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.**

(I) මේ වන විට තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන මණ්ඩලයට යොමු කර සඳහා අංක MT/04/09/DPC/55 හා 2019.04.25 දින ලිපිය මඟින් අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව වෙබ් අඩවිය ප්‍රකාශයට පත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසන ලෙස Procons infotech (pvt) LTD ආයතනයට උපදෙස් දී ඇත.

(II) ජාතික සමාජ සංවර්ධන ආයතනය විසින් සභාවේ ඉල්ලීම පරිදි ව්‍යාපෘති වාර්තාවක් මෙ වන විට ලබා දී ඇති අතර, එම වාර්තාව ජාතික සභාවේ සාමාජිකයන් වෙත යොමු කර ඉදිරි සභා වාරයේදී ඔවුන්ගේ අනුමැතිය සහ උපදෙස් අනුව අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට නියමිතය.

(III) ප්‍රවාහන ප්‍රතිපත්තිය සකස් කිරීම සම්බන්ධයෙන් මූලික කටයුතු කරනු ලැබුවේ අමාත්‍යාංශය හා ජාතික ගමනාගමන කොමිෂන් සභාවයි. එම ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වශයෙන් ලබාදිය යුතු උපරිම දායකත්වය ලබාදිය යුතු උපරිම දායකත්වය ලබා දුන් අතර, මේ වන විට ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය සකස් කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතී.

(IV) (V) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඔබ විසින් සඳහන් කර ඇති ආකාරයට මාර්ග ආරක්ෂාව ඇති කිරීම සඳහා වන කාර්යයන් ඇතුලත් කර ඇති අතර, එම කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික සභාවේ හා අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය මත මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ මුදල් වැයකර ඇත. එමෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සම්බන්ධ කර ගෙන වැඩසටහන් ජාතික සභාවේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර එම එම කටයුතු සම්බන්ධීකරනය කිරීම ද ජාතික සභාව මඟින් සිදු කරනු ලබයි.

- **(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන මුදල් චක්‍රලේඛයේ 3 (ඉ) වගන්තිය ප්‍රකාර ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.**

  මේ වන විට ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අවසන් කර ඇත.

(ආ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත පරිහරණය සඳහා ලබා දී ඇති වාහන අමාත්‍යාංශ සංචිතයෙන් ලබා දී ඇති වාහන වේ. මෙම වාහන වල නඩත්තු, වාර සේවා අලුත් වැඩියා සියල්ල සිදු කරනු ලබන්නේ අමාත්‍යාංශයේ පාලන අංශය මඟින් වන අතර, ඊට අදාල සියලු විස්තර එම අංශයෙන් ලබා ගන්නා ලෙස කාරුණිකව සඳහන් කරමි.

03. <u>අනෙකුත් විගණන නිරීක්ෂණ</u>

(අ) මේ වන විට කොමිෂන් සභාවක් බවට පත් කිරීමට අදාල කැබිනට් පත්‍රිකාව සකස් කර ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට ඉදිරිපත් කර ඇත.

(ආ) මේ වන විට දක්වා ඇති ව්‍යාපෘති වලින් බොහෝමයක් ව්‍යාපෘති අවසන් අදියරේ ක්‍රියාත්මක වේ.

(ඇ) අංක (I) හා (II) මගින් දක්වා ඇති තොරතුරු අනුව 2016,2017,2018 වර්ෂවල මාර්ග අනතුරු සම්බන්ධයෙන් දත්ත සසඳා බැලීමේදී සංඛ්‍යාත්මක වශයෙන් වැඩිවීමක් පෙන්නුම් කළද වාර්ෂිකව මාර්ගය භාවිත කරන මගීන්ගේ ප්‍රමාණය හා භාවිත කරන වාහන වල ප්‍රමාණය ඉතා වේගයෙන් ඉහළ යෑම සලකා බලන විට ප්‍රතිශතයක් ලෙස ගත් කල අනතුරු වල අඩුවීමක් හඳුනාගත හැක.

(ඈ) එකඟ විය හැක.

(ඉ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ඉදිරියේදී කොමිෂන් සභාවක් බවට පත් වූ පසු එහි කළමනාකරණ කටයුතු මැනවින් ඉටුකර ගැනීම සඳහා දැනට පවත්නා දෛනික වියදම් අවම මට්ටමක පවත්වාගෙන යනු ඇත.අතිරික්ත මුදල් භාණ්ඩාගාර බිල්පත් වල හා ස්ථාවර තැන්පතු වල ආයෝජනය කරනු ඇත.

වෛද්‍ය සිසිර කෝදාගොඩ,
සභාපති.
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව.